2024-08

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## පෙරදිග සංගීතය

විභාග අංකය:

| 07 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

Learning Resource Center
R
De Mazenod College
Kandana

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

❖ ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න .

01. ස්වර සප්තකය තුළ ප්‍රකෘති හා විකෘති වශයෙන් ස්වර
(1) 2 කි. (2) 4 කි. (3) 7 කි. (4) 12 කි.

02. ස්වර සප්තකය තුළ ස , ප ස්වර හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) අචල ස්වර (2) චල ස්වර (3) ප්‍රකෘති ස්වර (4) විකෘති ස්වර

03. ස්වර 2ක් පමණක් යොදා ගනිමින් නිර්මාණය වූ ස්වර ස්ථාපන ගීයක් වන්නේ කුමක් ද?
(1) එකට සතුටු සාගරේ (2) ගී ගයන මේ කුරුලු
(3) කඳු පෙළ අතරේ (4) කඳු කඳු නැගෙනා

04. "ම" ස්වරය අපරදිග සංගීතයට අනුව
(1) C (2) D (3) E (4) F

05. සුෂිර වර්ගයට අයත් සංගීත භාණ්ඩය වන්නේ කුමක් ද ?
(1) ගිටාරය (2) සිතාරය (3) සර්පිනාව (4) එස්රාජය

❖ ප්‍රශ්න අංක 06 – 10 තෙක් දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

( දාද්‍රා , කෙහෙර්වා , මාත්‍රා , තීව්‍ර මධ්‍යමය , ධෛවතය , මධ්‍ය ලය )

06. මහ තනි තිතට සමාන හින්දුස්ථානි තාලය .......................................... වේ .

07. \ එකට \ සතුටු \ සා ꞉ ග \ රේ ꞉ ꞉ \ යන ගී පාදයට වැයීමට සුදුසු තාලය......................... වේ .

08. ගීතයක් ගායනයේ දී සාමාන්‍ය වේගයෙන් ගැයීම .................................... වේ.

09. ශුද්ධ මධ්‍යමය හා පංචමය අතර ............................. පිහිටා ඇත .

10. කිරි සුදු හාවා ......................... 2න් 2 බෙදෙන ගී පාදය කි.

❖ **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණද යොදන්න.**

11. වයලීනයෙන් ගී අනුවාදනය කළ හැකි ය. ( )

12. "දිය ගොඩ සැම තැන" අවග්‍රහයෙන් ගැයෙන ගීයය කි . ( )

13. "සඳුන් කොකුම් මොර සුගාන" දරු නැලවිලි ගීයය කි . ( )

14. "දකුණ නැගෙනහිර" දේශාභිමානී ගීයය කි . ( )

15. "පොත පත කියවා" කෝමල ග, නි ස්වර ස්ථාපන ගීයය කි . ( )

❖ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා, A තීරුවට ගැළපෙන පිළිතුර B තීරුවෙන් ගළපා සා කරන්න.**

| A තීරුව | B තීරුව |
|---|---|
| 16. දන්න වං හුං අප | දේශාභිමානී ගීයය කි . |
| 17. නොමග නොයන් පුතේ | ශුද්ධ ස්වර ස්ථාපන ගීයය කි . |
| 18. බැතිනා සිරි පා | කෝලම් ගීයය කි . |
| 19. මේ උදාර ලංකා භූමියයි | නූර්ති ගීයය කි . |
| 20. ගම්භිර කාලිංග නුවර | උපදේශාත්මක ගීයය කි . |

(ලකුණු 1 X 20 = 20 )

## 7 ශ්‍රේණිය - පෙරදිග සංගීතය

### II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

1)

i) කෝමළ ග , නි යෙදෙන ස්වර ස්ථාපන ගීයක ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. (ලකුණු 6)

ii) ඉහත ප්‍රස්තාර කරන ලද ගීතයට වාදනය කළ යුතු තාලය නම් කර එම තාල පදය, මාත්‍රා, තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

2)

i) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ ප්‍රකෘති හා විකෘති ස්වර ලකුණු කරන්න. (ලකුණු 6)

ii) ස්වර පුවරු භාණ්ඩ 4 ක් නම් කරන්න. (ලකුණු 4)

3)

i) සජනක ප්‍රභේද කීය ද ? ඒවා නම් කර උදාහරණ දක්වන්න. (ලකුණු 6)

ii) සරිග , රිගම යන ස්වර අභ්‍යාසය උච්ච සඩ්ජය දක්වා වර්ධනය කරන්න. (ලකුණු 4)

4)

i) ඔබ තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් 4ක් නම් කරන්න. (ලකුණු 6)

ii) ඔබ කැමති සංගීත භාණ්ඩයක් පිළිබඳ සුවිශේෂී කරුණු 4ක් ලියන්න. (ලකුණු 4)

5)

i) සංගීතයේ දී "ලය" යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 3)

ii) ලයෙහි ප්‍රභේද කීය ද? ඒ මොනවා ද? (ලකුණු 3)

iii) මාත්‍රා 3/3, 4/4 බැගින් වූ තාලයන්ට අදාළ ගී පාදය බැගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

(ලකුණු 10 X 3 = 30)

REGISTRAR
De Mazenod College
Kandana.